මුදල් ප්‍රතිපත්ති විවරණය සැකෙවින්

2025 සැප්තැම්බර්

මහ බැංකුවේ අලුත් ම තීරණය කුමක් ද?

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය **නොවෙනස් ව** තැබීමට මහ බැංකුව තීරණය කළා **7.75%**

ආර්ථිකයේ වත්මන් තත්ත්වය?



- 2025 වසරේ පළමු භාගයේ දී ආර්ථිකය 4.8% කින් වර්ධනය වුණා
- පෞද්ගලික අංශයට මුදා හැරෙන ණය ඉහළ ගොස් ඇති අතර පොලී අනුපාතික අඩු වීම සහ ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් වීම ඊට හේතු වී තිබෙනවා
- වෙළෙඳ හිඟය පුළුල් වුව ද සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් ශක්තිමත් ව පැවතිණි
- ණය සේවාකරණයෙන් පසු ව වුව ද, 2025 වසරේ අගෝස්තු අවසානය වන විට දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 6.2ක මට්ටමේ පවත්වා ගැනීමට සමත් වී තිබෙනවා
- ශ්‍රී ලංකා රුපියල බොහෝ දුරට ස්ථායී ව පවතිනවා
- විශ්වාසය ඉහළ යාම තහවුරු කරමින්, ප්‍රධාන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන තුනම මෙරට ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නංවා තිබෙනවා

අනාගතයේ දී ආර්ථිකයට කුමක් සිදු විය හැකි ද?

- 2025 වසරේ දී 4.5% ක ආර්ථික වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කරනවා
- 2026 වසරේ මැද භාගය වන විට උද්ධමනය ක්‍රමයෙන් 5% ඉලක්කගත මට්ටමට ළඟාවනු ඇතැයි අපේක්ෂා කරනවා
- දේශීය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා සමීප ව නිරීක්ෂණය කරන අතර ආර්ථික වර්ධනයට සහාය වෙමින් උද්ධමනය ඉලක්කගත මට්ටමේ ස්ථායී ව පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව සූදානමින් සිටිනවා



75 YEARS
STABILITY FOR PROSPERITY
1950-2025